මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: බඩ්/සබ්ප/1/1/2012
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / Date: 2011.12.30

**ජාතික අයවැය චක්‍රලේඛ අංක 155**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් / පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් /
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**2012 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය**

01. **2012 වර්ෂය සඳහා වියදම් දැරීමේ අධිකාරී බලය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව 2011 දෙසැම්බර් 21 වෙනි දින පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබූ 2011 අංක 52 දරන විසර්ජන පනතට අනුව 2012 අයවැය ඇස්තමේන්තුවල ඇතුළත් ප්‍රතිපාදන, වියදම් කිරීම සඳහා අදාළ අධිකාරී බලපත්‍ර ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් අනුමත කරනු ලැබ ඇත.

ඒ අනුව, ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා 2012 අංක 01 දරන සාමාන්‍ය බලපත්‍රය
(ආ) විශේෂ නීති සේවා කටයුතු සඳහා 2012 අංක 01 දරන විශේෂ නීති අධිකාරී බලය
(ඇ) අන්තිකාරම් ගිණුම් කටයුතු සඳහා 2012 අංක 01 දරන අන්තිකාරම් බලපත්‍රය

02. **රාජ්‍ය වියදම් කළමනාකරණය**

2012 අයවැය කථාවෙන් යෝජිත පරිදි විසර්ජන පනත් කෙටුම්පත සමඟ ඉදිරිපත් කරනු ලැබූ 2012 අයවැය ඇස්තමේන්තු මගින් සලසා ඇති පුනරාවර්තන ප්‍රතිපාදන වලින් සියයට දෙකක් (2%) ද, මූලධන ප්‍රතිපාදන වලින් සියයට නවයක් (9%) ද, රජයේ වියදම් සකසුරුවම් ලෙස කළමනාකරණය කිරීමේ අපේක්ෂාවෙන් ඉතිරි කළ යුතු බවට යෝජනා කෙරිණි. ඒ අනුව, අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් මෙම පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන ඉතිරි කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු සඳහා ප්‍රමුඛත්වය දෙමින් කටයුතු කළ යුතු වේ.

2.1 **පුනරාවර්තන වියදම්**

පුනරාවර්තන වියදම්වලින් ඉතිරි කිරීමේදී වැටුප් හා වේතන ආශ්‍රිත අතිකාල දීමනා, අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා කරනු ලබන වියදම් වලින් ආයතනයේ ප්‍රමුඛ ක්‍රියාකාරකම් අඛණ්ඩව හා බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට හැකිවන පරිදි සියයට 2 ක ඉතිරි කිරීමක් කිරීම කෙරෙහි අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ප්‍රධාන ගණකාධිකාරීවරුන් වගබලා ගත යුතුය.

2.2 **මූලධන වියදම්**

මූලධන වියදම්වලින් ඉතිරි කිරීමේදී, මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, විදේශ මූල්‍යනය යටතේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘති හා පළාත් සභාවල මූලධන වියදම් සඳහා සලසා ඇති ප්‍රතිපාදන ද ඇතුළත්ව ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතන වෙත සලසා දී ඇති මූලධන ප්‍රතිපාදන වලින් අවශ්‍ය ඉතිරි කිරීම් සිදුකළ යුතුය.

2.3 මෙම අපේක්ෂිත ඉතිරිකිරීම් හඳුනා ගැනීමේදී ප්‍රමුඛතා පදනමින් සිදුකළ යුතු නොවන මූලධන වැඩසටහන් වල වියදම් සුපරීක්ෂාකාරීව මෙහෙයවීම මෙන්ම අරපිරිමැස්මෙන් යුතුව වියදම් දැරීම තුලින්ද අපේක්ෂිත ඉතිරිවීම් සලසා ගත හැකි වනු ඇත.

2.4 එසේ ඉතිරි කරන ලද වැය විෂයයන් සඳහා මෙම වර්ෂය තුළදී අතිරේක ප්‍රතිපාදන ලබාදීම හෝ මුදල් රෙගුලාසි යටතේ මාරු කිරීම් සඳහා අනුමැතිය ලබා නොදෙනු ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මුදල් නිකුත් කිරීමේදී කාර්තුමය වශයෙන් පැනවෙන සීමාවන් තුළ මුදල් නිකුත් කරනු ඇති අතර, ඉහත ඉතිරි කිරීම් ළඟා කර ගැනීම සඳහා අයවැය දෙපාර්තමේන්තුව විසින් අදාළ ප්‍රතිපාදන උපයෝජනය අධීක්ෂණය කරනු ඇත.

2.5 සියලු අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් යෝජිත ඉතිරිකිරීම් ඇතුළත් වන පරිදි සකස් කළ සංශෝධිත ඇස්තමේන්තු 2012.01.16 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමෙන් මෙම කාර්යය පහසුවෙන් සම්බන්ධීකරණය කළ යුතුය.

03. **අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවයන් පිළිබඳව සලකා බැලීම**

3.1 2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අයවැය ඇස්තමේන්තු මගින් සලසා ඇති ප්‍රතිපාදන ඇතුළත තම ආයතනයන්හි වාර්ෂික වියදම් දැරීම ප්‍රශස්ත ලෙස සැලසුම් කිරීමට අවශ්‍ය පියවර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ගණන්දීමේ නිලධාරීන්ගේ මූලික වගකීමක් වනු ඇත. එබැවින්, 2012 වාර්ෂික වියදම් සැලසුම් සහ මාසික මුදල් අග්‍රිම අවශ්‍යතාවය පිළිබඳ වාර්තා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

3.2 2012 මුද්‍රිත ඇස්තමේන්තුවල "අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය යටතේ නිශ්චිතව සඳහන් කළ කාර්යයන් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ඇති

අතර, ඉන් පරිබාහිර කරුණු සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා දීමට හැකියාවක් නොමැත. එබැවින්, අනපේක්ෂිත හා හදිසි තත්ත්වයන් සඳහා මුහුණදීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන පවත්වා ගත යුතු බැවින්, පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට අවකාශ නොමැති බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරීන්ගේ විශේෂ අවධානයට යොමු කරනු ලැබේ.

3.3 අනපේක්ෂිත සහ හදිසි මෙන්ම රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ඉටු කළ යුතු වියදම් වැඩසටහන් සඳහා භාණ්ඩාගාරයට ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී අදාළ වැඩසටහන් සම්බන්ධව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සහ සනාථ කිරීම්ද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේම, අතිරේක මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පෙර තම වැය ශීර්ෂයන්හි වියදම් නොවූ ප්‍රතිපාදන ප්‍රමාණයන් හෝ ආරම්භ කරනු නොලැබූ කාර්යයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන, ඒ සඳහා යොදවා ගැනීමේ ඇති හැකියාව පිළිබඳව ප්‍රථමයෙන් සොයා බැලීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි.

## 04. අත්තිකාරම් ගිණුම් කටයුතු

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතේ දැක්වෙන උපරිම වියදම් සීමාව තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු කළමනාකරණය කර ගත යුතුය. තවද, මෙම සීමාව තුළ රාජ්‍ය රජයේ සේවකයෙකු සඳහා ගෙවිය හැකි සමස්ත ආපදා ණය ප්‍රමාණය රුපියල් 250,000/- ක උපරිමයකට සීමා කළ යුතුය.

## 05. 2012 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අයවැය යෝජනා, කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර අදාළ යෝජනා වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම්ගත පරිදි නිශ්චිත කාල පරාසයන් තුළ අවසන් කිරීම කෙරෙහිද විශේෂ අවධානය යොමු කළ යුතු වේ. එබැවින්, ඔබ අමාත්‍යාංශයට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාලරාමුවකට අනුව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ජාතික අයවැය දෙපාර්තමේන්තුවට පිටපතක්ද සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2012.01.25 දිනට ප්‍රථම ඉදිරිපත් කිරීමට පියවර ගත යුතු වේ.

06. මෙම චක්‍රලේඛය පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඒ.කේ. සෙනෙවිරත්න මහතා (දුරකථන අංක : 011 2484669) හෝ අධ්‍යක්ෂ එස්.එම්. පියතිස්ස මහතා (දුරකථන අංක : 011 2484688) ඇමතීමෙන් ලබාගත හැක.

පී.බී. ජයසුන්දර
ලේකම්
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති